ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තානාපති කාර්යාලය - රුසියානු සමූහ මණ්ඩලය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின் தூதராலயம் - ரஷ்யா சமஷ்டி அரசு
EMBASSY OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA IN THE RUSSIAN FEDERATION

# පුවත් පත් නිවේදනය

## දැවැන්ත සංචාරක ප්‍රවර්ධන වැඩ සටහන් රැසක් රුසියාවේ හා පැරණි සෝවියට් දේශයට අයත් රටවල මේ වසරේත්

පසුගිය වසරේ රුසියාවේ තෝරාගත් නගර කිහිපයක හා බෙලරුසියාවේ මෙන්ම යුක්රේනයේ පවත්වනු ලැබූ සංචාරක ප්‍රවර්ධන වැඩ සටහන් වල සාර්ථකත්වය මත රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ පූර්ණ අනුග්‍රහය සහිතව එවැනිම වැඩ සටහන් රැසක් මේ වසරේද රුසියාවේ, ආර්මේනියාවේ, බෙලරුසියාවේ, යුක්රේනයේ හා මොල්දාවියාවේ තෝරා ගත් නගර කීපයක පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. පැරණි සෝවියට් දේශයට අයත්ව තිබී දැන් ස්වාධීන රටවල් වන මෙම සියලු රටවල් වල ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ලෙස කටයුතු කරන්නේ රුසියාවේ මොස්කව් නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයයි.

මෙම වසරේ ප්‍රවර්ධන වැඩ සටහන් වල මුල් අදියරේ වැඩ සටහන රුසියාවේ හා ආර්මේනියාවේ පැවත්වීමට සියලු කටයුතු දැන් සූදානම් කර ඇති අතර එය 2014 මැයි මස 29 වනදා මොස්කව් නුවරින් ආරම්භ කිරීමට නියමිතය. දින තුනක් තිස්සේ මොස්කව් නුවරදී පැවැත්වෙන වැඩ සටහන විචිත්‍ර ශ්‍රී ලාංකික සංස්කෘතික සංදර්ශන, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රමුඛ නියෝජිතයන් සඳහා වන වැඩ මුළු, ශ්‍රී ලංකාව පිලිබඳ ඡායාරූප ප්‍රදර්ශන, ආයුර්වේද හා හස්ත කර්මාන්ත වැඩමුළු හා ප්‍රදර්ශන ආදියෙන් සමන්විත වේ. ඉන් අනතුරුව මෙම වැඩ සටහන කසාන්, සමාරා, සරාතොව්, වොල්ගාග්‍රාද්, දොන් නදී අසබඩ රස්තොව් යන රුසියානු නගර වලත් පැවැත්වෙන අතර 2014 ජුනි 16 වන දින ආර්මේනියාවේ අගනුවර වන යෙරේවාන් නගරයෙන් මුල් අදියර සමාප්ත කෙරේ. ශ්‍රී ලංකාවේ නම ගිය සංස්කෘතික කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන මන බන්ධනීය සංදර්ශන සියලු නගර වල ප්‍රධාන වෙළඳ සංකීර්ණ වලත් එළිමහන් ස්ථාන වලත් ඉදිරිපත් කෙරෙන අතර වැඩ සටහන් පැවැත්වෙන ස්ථාන වල දී එහි පැමිණෙන්නන්හට ශ්‍රී ලංකා තේ කෝප්පයක රස බැලීමටද කටයුතු සූදානම් කර ඇත. මෙම වැඩ සටහන පුරා සති තුනක් තිස්සේ එහි සියලු අංගෝපාංගයන් සහිතව සියලුම නගර වලදී පැවැත්වීම එහි විශේෂත්වයයි. එසේම වැඩ සටහන පැවැත්වෙන නගර තෝරා ගැනීමේදී ජනගහනය මිලියන එකකට වඩා වැඩි නගර තෝරා ගැනීමට ප්‍රමුඛත්වය ලබා දී ඇති අතර එම නගරවල සිට ශ්‍රී ලංකාවට කෙලින්ම ගුවන් ගමන් පහසුකම් තිබීමද අනිවාර්යයෙන් සලකා බැලීමට තානාපති කාර්යාලය ක්‍රියා කර ඇත.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ දත්ත අනුව 2014 අප්‍රේල් මස ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම 2013 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව සියයට 39.5 කින් වැඩි වී ඇත. රුසියානු හා පැරණි සෝවියට් සමූහාණ්ඩු වලින් පැමිණෙන සංචාරකයන්ගේ වැඩිවීමද මෙම වර්ධනයට සාධනීය ලෙස බලපා ඇත. මෙම වසරේ මුල් මාස හතරේ රුසියාවෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව පමණක් සියයට 81.1 කින් වැඩිවී තිබීමෙන් මේ බව තහවුරු වෙයි. පසුගිය වසරේ රුසියාවේ, බෙලරුසියාවේ මෙන්ම යුක්රේනයේ පවත්වනු ලැබූ සංචාරක ප්‍රවර්ධන වැඩ සටහන් ශ්‍රී ලංකාව පිලිබඳ එම රටවල සංචාරකයන් අතර දැනුවත් බව ඇති කිරීමටත් ඒ අනුව මෙම වර්ධනයටත් දායක වී ඇති බව නිසැකව කිව හැකිය. මෙම වසරේ පවත්වන ප්‍රවර්ධන වැඩ සටහන් මෙම දැනුවත් බව තව දුරටත් තීව්‍ර කිරීමටත් ශ්‍රී ලංකාව

ПОСОЛЬСТВО ДЕМОКРАТИЧЕСКОЙ СОЦИАЛИСТИЧЕСКОЙ РЕСПУБЛИКИ ШРИ ЛАНКА В РОССИЙСКОЙ ФЕДЕРАЦИИ
Ulitsa Shepkina - 24 Moscow 129090 Russia. www.srilankaembassy.org Россия, 129090 Москва, Ул.Щепкина, 24
Telephone: +7 495 688 1620, 688 1651, 688 1463 Fax: +7 495 688 1757 E-Mail: moscow@srilankaembassy.org

හා මෙම රටවල් අතර සංස්කෘතික, සමාජයීය හා ව්‍යාපාරික සබඳතා ප්‍රවර්ධනයටත් මහඟු පිටිවහලක් වනු ඇති බව නිසැකය.

රුසියාවේ ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංග මහතා පුද්ගලිකවම මෙම වැඩ සටහන අධීක්ෂණය කිරීමත් මෙහෙයවීමත් සිදු කරන අතර සංචාරක ක්ෂේත්‍රයේ නියෝජිතයන්ට පවත්වන වැඩ මුළුද ඔහු විසින්ම රුසියානු භාෂාවෙන් සිදු කරනු ඇත.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
මොස්කව්, රුසියාව
2014 මැයි 8 වන දින